විදුලි පණිවුඩ : "විශ්‍රාම වැටුප්" කොළඹ
தந்தி : "ஓய்வூதியம்" கொழும்பு
Telegrams : "PENSIONS" Colombo

දුරකථන
தொலைபேசி
Telephones
2320316
2421786
2431305

ෆැක්ස්
பெக்ஸ்
Fax
2342078

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.
மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.
Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.

මගේ අංකය
எனது இல.
My No. විවැ/චක්‍රලේඛ/2006

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2006.12.15

<u>විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 19/2006</u>

ප්‍රාදේශීය ලේකම් මගින්,
සියළුම ග්‍රාම නිලධාරීන් වෙත.

රජයේ විශ්‍රාම වැටුප් ගෙවීම බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීම
<u>(ග්‍රාම නිලධාරීන් වෙත වගකීම පැවරීම)</u>

රජයේ විශ්‍රාම වැටුප් ගෙවීම බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීමට මෙම දෙපාර්තමේන්තුව විසින් තීරණය කර ඇති අතර ඒ සම්බන්ධව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10/2006 යටතේ නිසි උපදෙස් නිකුත් කොට ඇත. මෙම නව ගෙවීම් ක්‍රමය තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණ කිහිපයක් පවතී.

1 ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් විශ්‍රාමිකයින් වෙත යවනු ලබන මාසික විශ්‍රාම වැටුප් කුවිතාන්සිය අත්හිටුවීම
2 විශ්‍රාමිකයින්ගේ බැංකු ගිණුම්වලට මාසික විශ්‍රාම වැටුප සෘජුව බැර කිරීම
3 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු විසින් ඒ ඒ බැංකු වෙත සෘජුව මුදල් බැර කිරීම
4 තැපැල් කාර්යාල මගින් විශ්‍රාම වැටුප් ගෙවීම මාසික විශ්‍රාම වැටුප් කුවිතාන්සි යැවීමකින් තොරව සිදුකිරීම
5 සියළුම විශ්‍රාමිකයින් වාර්ෂිකව, ජීවිත සහතිකයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඉදිරිපත් කිරීම

ග්‍රාම නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් විෂය සම්බන්ධ වගකීම පැවරීම

ග්‍රාම නිලධාරීන් වෙත ඒ ඒ වසම් මට්ටමින් විශ්‍රාමිකයින් පිළිබඳ තොරතුරු ලබාදීමට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සියවර ගත යුතුය. එමෙන්ම යම් විශ්‍රාමිකයෙකු මිය ගිය වහාම එම තොරතුරු ලබාගෙන පරිගණක වැඩසටහනෙහි දත්ත සංශෝධනය කිරීමට වැඩිදුරටත් ක්‍රියාකල යුතුය. විශ්‍රාම වැටුප් විෂය සම්බන්ධ පහත සඳහන් කටයුතු ග්‍රාම නිලධාරීන් වෙත පවරනු ලැබේ.

1 ග්‍රාම නිලධාරී වසමේ සිටින විශ්‍රාමිකයින්ගේ ලේඛනයක් නඩත්තු කිරීම

2 එම ලේඛනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලේඛනය සමඟ සසඳා බලා යාවත්කාලීන කිරීම

3 තම කොට්ඨාශයේ යම් විශ්‍රාමිකයෙක් මිය ගියහොත් දින 07 ක් ඇතුළත විශ්‍රාම වැටුප අංකය සහිතව ඒ බව වහාම විශ්‍රාම වැටුප් ලබා ගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැනුම් දීම

4 යම් විශ්‍රාමිකයෙකු තාවකාලිකව හෝ ස්ථීර පදිංචිය වෙනස් කරන්නේ නම් ඒ බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත වාර්තා කිරීම

5 විශ්‍රාම වැටුප ලබාගැනීමට තැපැල් කාර්යාලය වෙත හෝ බැංකුව වෙත යාමට අපහසු විශ්‍රාමිකයින්ගේ ඉල්ලීම සලකා බලා ඒ බව සනාථ කරමින් භාරකරුවෙකුට විශ්‍රාම වැටුප් ගෙවීම නිර්දේශ කිරීමේ සහතික නිකුත් කිරීම

6 විශ්‍රාමිකයාගේ වැන්දඹුව, අනත්දරුවන් යලි විවාහ වූවිට ඒ බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත වාර්තා කිරීම

7 ආබාධිත විශ්‍රාම වැටුප්, භාරකරුවන් වෙත ගෙවීමේදී එම භාරකරුවන් ආබාධිතයාට නිසි රැකවරණය සලසන්නේද යන්න සොයා බැලීම හා ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා කිරීම

8 ආබාධිත විශ්‍රාම වැටුප් ලාභියෙක් මියගිය විට භාරකරු තවදුරටත් විශ්‍රාම වැටුප ලබා ගන්නේද යන්න සොයා බලා ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා කිරීම

9 වාර්ෂිකව විශ්‍රාමිකයින් සැපයිය යුතු ජීවිත සහිකය ඔවුන් වෙත ලබාදීමට කටයුතු කිරීම සහ ඒවා සහිතක කිරීම

ඉහත වගකීම් ග්‍රාම නිලධාරි වෙත පවරනු ලබන්නේ ඔවුන් දැනටමත් විශ්‍රාමිකයින් සම්බන්ධව සපයනු ලබන තොරතුරු හා වාර්තාවලට අමතර වශයෙනි. විශේෂයෙන්ම මෑත වර්ෂවලදී විශ්‍රාමිකයින් මියගිය පසු වෙනත් පුද්ගලයින් දිගින් දිගටම එම විශ්‍රාම වැටුප් ලබාගනිමින් වංචා සිදුකොට ඇති බැවින් ග්‍රාම නිලධාරීන් වෙත මෙම වගකීම පැවරීමට තීරණය කර ඇති බවට වැඩිදුරටත් දන්වමි.

මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ලේකම්ගේ එකඟත්වය ඇතිව නිකුත් කරන ලදී.

කේ.ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත: 1 ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
2 ලේකම්, ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
3 ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ග්‍රාම නිලධාරි),රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.
4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්
5 සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
6 විගණකාධිපති